පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

පුරනැඟුම ව්‍යාපෘතිය

තනතුරු ඇබෑර්තු

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර යටතේ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සහ ඒවායේ සේවා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සහ වකුගඩු රෝග බහුල ප්‍රදේශ සඳහා ජල යෝජනා ක්‍රම ඇති කිරීම සඳහා ඉහත ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. එම ව්‍යාපෘතියේ පවතින පහත සඳහන් පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ව්‍යාපෘතියේ මුළු වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 119 කි.

01. ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු / අනුකූලතා නිලධාරී (තනතුරු 01, උතුරු මැද පළාත)

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිවිල් ඉංජිනේරු උපාධිය

සමග

ඉහත සුදුසුකම් සපිරීමෙන් පසු අවම වශයෙන් වසර 12 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද සහිතවීම. එයින් වසර 6 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු අතර, වසර 02 ක් ප්‍රසම්පාදන පළපුරුද්ද තිබිය යුතුය.

ඉදිකිරීම් කළමනාකරණය, පරිපාලනය / මෙහෙයුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් ලබා තිබීම අතිරේක සුදුසුකමක් වේ.

හෝ

02. විශ්වවිද්‍යාල කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් සිවිල් ඉංජිනේරු පිළිබඳව උපාධියක් ලබා තිබීම

සහ

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීමය ආයතනයකින් ලබාගත් පූර්ණ කාලීන සාමාජිකත්වය

සමග

සුදුසුකම් සපිරීමෙන් පසු වසර 10 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබීම සහ එයින් වසර 02 ක් ප්‍රසම්පාදන පළපුරුද්ද තිබිය යුතුය.

ඉදිකිරීම් කළමනාකරණය, පරිපාලනය / මෙහෙයුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් ලබා තිබීම අතිරේක සුදුසුකමක් වේ.

වැටුප් තලය : 2016.03.24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ PS 3 මට්ටම. (රු. 160,000 - රු. 175,000)

ඉහත වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

02. ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු - (තනතුරු 02, වයඹ සහ උතුරු මැද පළාත)

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිවිල් ඉංජිනේරු උපාධිය

සමග

ඉහත සුදුසුකම් සපිරීමෙන් පසු අවම වශයෙන් වසර 12 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද සහිතවීම. එයින් වසර 6 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

ඉදිකිරීම් කළමනාකරණය, පරිපාලනය / මෙහෙයුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් ලබා තිබීම සහ පානීය ජල ව්‍යාපෘතිවල පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වේ.

හෝ

02. විශ්වවිද්‍යාල කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් සිවිල් ඉංජිනේරු පිළිබඳව උපාධියක් ලබා තිබීම.

සහ

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීමය ආයතනයකින් ලබාගත් පූර්ණ කාලීන සාමාජිකත්වය

සමග

සුදුසුකම් සපිරීමෙන් පසු වසර 10 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබීම.

ඉදිකිරීම් කළමනාකරණය, පරිපාලනය / මෙහෙයුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් ලබා තිබීම සහ පානීය ජල ව්‍යාපෘතිවල පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වේ.

වැටුප් තලය : 2016.03.24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ PS 3 මට්ටම. (රු. 160,000 - රු. 175,000)

ඉහත වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

03. ඉංජිනේරු (සිවිල්) - (තනතුරු 01, උතුරු මැද පළාත)

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිවිල් ඉංජිනේරු උපාධිය

හෝ

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් පවත්වනු ලබන කාණ්ඩ I/II විභාගය සමත් වීම

සමග

ඉහත සුදුසුකම් සපිරීමෙන් පසු සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද

පානීය ජල සම්පාදන ව්‍යාපෘතිවල සේවය කර තිබීම අතිරේක සුදුසුකමක් වේ.

හෝ

02. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II/III පන්තියේ නිලධාරියකු ලෙස හෝ සමාන මට්ටමේ සුදුසුකම් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ලබා තිබීම

සමග

අවම වශයෙන් III/II පන්තියේ තනතුරක වසර 09 ක පළපුරුද්ද.

පානීය ජල සම්පාදන ව්‍යාපෘතිවල සේවය කර තිබීම අතිරේක සුදුසුකමක් වේ.

වැටුප් තලය : 2016.03.24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ PS 4 මට්ටම. (රු. 135,000 - රු. 150,000)

ඉහත වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

04. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන)
(තනතුරු 01, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, කොළඹ)

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආර්ථික විද්‍යාව / ගණකාධිකරණය පිළිබඳ උපාධිය

හෝ

පිළිගත් වෘත්තීමය ආයතනයක් මගින් පවත්වනු ලබන ක්ෂේත්‍රයට අදාළ මධ්‍යම මට්ටමේ විභාගය සමත්වීම

සමග

ඉහත සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 08 ක පළපුරුද්දක් තිබීම සහ එයින් වසර 03 ක් පිළිගත් ආයතනයක විගණනය පිළිබඳ පළපුරුද්ද තිබීම.

හෝ

02. ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ III/II පන්තියේ හෝ ඊට ඉහළ නිලධාරියකු ලෙස හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන මට්ටමේ තනතුරක සේවය කර තිබීම.

සමග

අවම වශයෙන් II/III පන්තියේ තනතුරක වසර 09 ක පළපුරුද්දක් තිබීම සහ එයින් වසර 03 ක් පිළිගත් ආයතනයක විගණනය පිළිබඳ පළපුරුද්ද තිබීම.

වැටුප් තලය : 2016.03.24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ PS 4 මට්ටම. (රු. 135,000 - රු. 150,000)

ඉහත වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

05. සහකාර ඉංජිනේරු (සිවිල්) - (තනතුරු 01, මධ්‍යම පළාත)

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිවිල් ඉංජිනේරු උපාධිය

හෝ

තාක්ෂණික ක්ෂේත්‍රය පිළිබඳව තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් ලබාදෙන ලද ජාතික වෘත්තීය නිපුණතා ප්‍රවීනතා සහතිකය (NVQ) - 7 වන මට්ටම (අවම වශයෙන් 7 වන මට්ටම) සපුරා තිබිය යුතුය.

සමග

අවම වශයෙන් වසර 03 ක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුද්ද

පානීය ජල සම්පාදන ව්‍යාපෘතිවල සේවය කර තිබීම අතිරේක සුදුසුකමක් වේ.

හෝ

02. තාක්ෂණික ක්ෂේත්‍රය පිළිබඳව තෘතීයික අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් ලබාදෙන ලද ජාතික වෘත්තීය නිපුණතා ප්‍රවීනතා සහතිකය (NVQ) - 6 වන මට්ටම (අවම වශයෙන් 6 වන මට්ටම) සපුරා තිබිය යුතුය.

සමග

අවම වශයෙන් වසර 08 ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද

පානීය ජල සම්පාදන ව්‍යාපෘතිවල සේවය කර තිබීම අතිරේක සුදුසුකමක් වේ.

හෝ

03. තාක්ෂණික ක්ෂේත්‍රය පිළිබඳව තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් ලබාදෙන ලද ජාතික වෘත්තීය නිපුණතා ප්‍රවීනතා සහතිකය (NVQ) - 5 වන මට්ටම (අවම වශයෙන් 5 වන මට්ටම) සපුරා තිබිය යුතුය.

සමග

අවම වශයෙන් වසර 13 ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද

පානීය ජල සම්පාදන ව්‍යාපෘතිවල සේවය කර තිබීම අතිරේක සුදුසුකමක් වේ.

වැටුප් තලය : 2016.03.24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ PS 6 මට්ටම. (රු. 62,000 - රු. 67,000)

ඉහත වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

06. සහකාර ප්‍රමාණ සමීක්ෂක - (තනතුරු 01, ඌව පළාත)

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ ක්ෂේත්‍රය පිළිබඳව ලබාගත් උපාධිය

හෝ

අදාළ ක්ෂේත්‍රය පිළිබඳව තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය නිපුණතා ප්‍රවීණතා සහතිකය (NVQ) - 7 වන මට්ටම

සමග

අවම වශයෙන් වසර 03 ක අදාළ ක්ෂේත්‍රය පිළිබඳව පළපුරුද්ද

හෝ

02. අදාළ ක්ෂේත්‍රය පිළිබඳව තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය නිපුණතා ප්‍රවීණතා සහතිකය (NVQ) - 6 වන මට්ටම

සමග

අවම වශයෙන් වසර 08 ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද

හෝ

03. අදාළ ක්ෂේත්‍රය පිළිබඳ තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය නිපුණතා ප්‍රවීනතා සහතිකය (NVQ) - 5 වන මට්ටම

අවම වශයෙන් වසර 13 ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද

පානීය ජල සම්පාදන ව්‍යාපෘතිවල සේවය කර තිබීම අතිරේක සුදුසුකමක් වේ.

වැටුප් තලය : 2016.03.24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ PS 6 මට්ටම. (රු. 62,000 - රු. 67,000)

ඉහත වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

07. ව්‍යාපෘති ලේකම් / පරිපාලන සහකාර (තනතුරු 01, දකුණු පළාත)

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

01. ඉංග්‍රීසි සහ සිංහල/ දෙමළ භාෂාවන් ඇතුළු සම්මාන තුනක් (03) සහිතව අවම වශයෙන් විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත්වී තිබීම

සමග

පිළිගත් ආයතනයකින් ලේකම් පාඨමාලාවක් හදාරා තිබීම

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්ද ලබා තිබීම

විදේශ ආධාර ව්‍යාපෘතිවල සේවය කර තිබීම අතිරේක සුදුසුකමක් වේ.

හෝ

02. අදාළ ක්ෂේත්‍රයේ වසර හතරක (04) පළපුරුද්දක් සහිත වරලත් ලේකම්වරයෙකු / විධායක ලෙස කටයුතු කර තිබීම

විදේශ ආධාර ව්‍යාපෘතිවල සේවය කර තිබීම අතිරේක සුදුසුකමක් වේ.

වැටුප් තලය : 2016.03.24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ PS 6 මට්ටම. (රු. 62,000 - රු. 67,000)

ඉහත වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

08. ගිණුම් සහායක - (තනතුරු 03, මධ්‍යම, උතුරුමැද සහ දකුණු පළාත)

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

(අ) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

AAT / ගණකාධිකරණ ඩිප්ලෝමාව / වරලත් ගණකාධිකාරී අදියර II සමත්ව තිබීම. ගිණුම් සහකාරවරයෙකු වශයෙන් රජයේ හෝ පෞද්ගලික ආයතනයක සේවය කර තිබීම සහ විදේශ ආධාර ව්‍යාපෘතිවල සේවය කර තිබීම අතිරේක සුදුසුකම් වේ.

වැටුප් තලය : 2016.03.24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය.

ඉහත වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

09. පරිගණක දත්ත සටහන්කරු -
(තනතුරු 02 - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ දකුණු පළාත)

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළු සම්මාන පහක් (05) සහිතව විෂයන් හයකින් එකවර සමත් වීම.

වෘත්තීය සුදුසුකම්

තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමේ හෝ ඊට ඉහළ පරිගණක / තොරතුරු තාක්ෂණ පාඨමාලාවක් හදාරා තිබීම.

රජයේ හෝ පෞද්ගලික ආයතනයක අදාළ තනතුරක සේවය කර තිබීම සහ විදේශ ආධාර ව්‍යාපෘතිවල සේවය කර තිබීම අතිරේක සුදුසුකම් වේ.

වැටුප් තලය : 2016.03.24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය.

ඉහත වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

පොදු කොන්දේසි :

- වයස : 2017 අප්‍රේල් 17 වන දිනට අවුරුදු 65 ට අඩු විය යුතුය.
- සේවකයාගේ සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම ප්‍රතිශතය මාසික වැටුපෙන් 8% ක්ද, සේවායෝජකයාගේ සේවක අර්ථසාධක අරමුදල් ගෙවීමේ ප්‍රතිශතය 12% ක්ද, සේවක භාරකාර අරමුදල් සඳහා ගෙවීම 3% ක්ද වේ.
- සේවා කොන්දේසි - සියලුම බඳවා ගැනීම් මූලික වශයෙන් එක් වසරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වන අතර, ව්‍යාපෘති සීමාව, තනතුරේ අවශ්‍යතාවය සහ සතුටුදායක කාර්ය සාධනය මත සේවා කාලය වාර්ෂිකව කොන්ත්‍රාත් පදනම මත දීර්ඝ කිරීමේ අවස්ථාව පවතී.

රාජ්‍ය අංශයේ සේවය කරන නිලධාරීන් සිය අයදුම්පත්‍ර ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර, මේ සඳහා උනන්දුවක් දක්වන පුද්ගලයන් ඔවුන්ගේ ජීව දත්ත තොරතුරු අදාළ අධ්‍යාපන සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතික වල පිටපත් සමඟ ව්‍යාපෘති අධ්‍යක්ෂ, පුරනැඟුම ව්‍යාපෘතිය, ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, 2 වන මහල, අංක 191ඒ, ධර්මපාල මාවත, කොළඹ 07 ලිපිනයට 2017 අප්‍රේල් 17 වන දින ප.ව. 3.00 ට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ව්‍යාපෘතියේ නම සහ ඉල්ලුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ වම් පස කෙළවර සඳහන් කළ යුතුය. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එච්.ටී. කමල් පත්මසිරි
ලේකම්,
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
අංක. 330, යුනියන් පෙදෙස, කොළඹ 02.
2017.03.26